ගරු ස්වාමීන් වහන්ස/ප්‍රිය ශිෂ්‍යයනි/ශිෂ්‍යාවනි,

**බාහිර උපාධි අපේක්ෂකයින් සඳහා සම්මන්ත්‍රණ මාලාව පැවැත්වීම.**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග - 2014 පරීක්ෂණය සඳහා පෙනී සිටින බාහිර උපාධි පුනර් (Repeat) අපේක්ෂක සිසුන් සඳහා විශ්වවිද්‍යාල මහාචාර්යවරුන් හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් මෙහෙයවන විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ මාලාව මෙවර ද පැවැත්වීමට නියමිත ව ඇත. බාහිර සිසුන්ගේ විෂය දැනුම වර්ධනය කර ගැනීම සඳහා මෙන් ම පරීක්ෂණයන්ට අදාළ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා මෙම ප්‍රතිපෝෂක වැඩසටහන උපකාරී වන බැවින්, ඒ සඳහා සහභාගි වන ලෙස දන්වා සිටින අතර, එම සම්මන්ත්‍රණ මාලාව ඒ ඒ පරීක්ෂණ පැවැත්වීමට ප්‍රථම සති අන්ත නිවාඩු දිනවල හා රජයේ නිවාඩු දිනවල පැවැත්වීමට නියමිත ය. **පාලි** විෂය හැර අනෙක් සියලුම විෂයයන් සඳහා මෙම සම්මන්ත්‍රණ මාලාව පැවැත්වේ.

මෙම සම්මන්ත්‍රණ මාලාව සඳහා පහත සඳහන් ගාස්තු අයකරනු ලැබේ.

| | |
|---|---|
| එක් පත්‍රයක් සඳහා | රු. 500.00 |
| පත්‍ර දෙකක් සඳහා | රු. 1000.00 |
| පත්‍ර තුනක් සඳහා | රු. 1500.00 |
| පත්‍ර හතරක් සඳහා හෝ ඊට වැඩි | රු. 2000.00 |

මෙම සම්මන්ත්‍රණ සඳහා සහභාගි වීමට කැමති සිසුන් පහත ඇති අයදුම්පත්‍රය පුරවා, අදාළ සම්මන්ත්‍රණ ගාස්තු බැංකු වවුචර් පත් මගින් මහජන බැංකුවේ උයන්වත්ත ශාඛාවේ අංක 032-1-001-2477594 දරණ රුහුණ විශ්වවිද්‍යාලයේ බාහිර විභාග ගිණුමට බැරවන සේ දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකි අතර එම ගෙවීම් වවුචරය ද සමග අදාළ සම්මන්ත්‍රණ සඳහා නියමිත අයදුම්පත්‍ර 2016.11.30 දිනට ප්‍රථම "සහකාර ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර." යන ලිපිනයට තැපෑලෙන් හෝ පැමිණ බාරදිය යුතු ය.

ඒ සමග අදාළ අවසර පත්‍රය හා උපදෙස් එවීම සඳහා ඔබගේ නම සහ ලිපිනය ලියූ රු.15/=ක් වටිනා මුද්දර ඇලවූ 9'× 4' ප්‍රමාණයේ ලිපි කවරයක් එවිය යුතු ය.

**සම්මන්ත්‍රණ මාලාව සඳහා නියමිත දිනට පසුව කිසිදු විෂයයක් සඳහා මුදල් ගෙවීමට අවසර නොදෙන බව වැඩිදුරටත් දන්වා සිටිමි.**

**අයදුම්පත් බාරගන්නා අවසාන දිනය 2016.11.30**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය.